# කුණු කසළ ප්‍රශ්නයක් ද? මෙන්න එයට විසඳුමක්



අද ලංකාවේ සෑම නගර සභාවකට මෙන් ම ප්‍රදේශීය සභාවකට ද බලවත් ප්‍රශ්නයක් වි ඇත්තේ කුණු කසල යි. මේ ප්‍රශ්නය ඉතා බැරෑරුම්ව බලපානුයේ හුදෙක් ජනාකීර්ණ නාගරික ප්‍රදේශවලට යි. කුණු කසළ දැමීමෙන් පරිසරය අපවිත්‍ර වනවා පමණක් නොව පරිභරණයට ගන්නා ජලය, ගංගා සහ ජලාශයන් දූෂිත වීම ද සිදුකෙරෙන අතර, ජල මාර්ග ඇලවල් සහ ගංගාවලට කැළි කසළ එක්වීමෙන් ඒවා දූෂිත වනවා පමණක් නොව මාරාන්තික රෝගීන්ට ද මුහුණපෑමට සිදුවන බව රහසක් නොවේ.

දළ වශයෙන් කුණු කසළ වර්ග දෙකකට වෙන් කළ හැකි ය. ඒවා මෙසේ ය.

(1) දිරාපත්වන කුණු කසළ හා

(2) දිරාපත් නොවන කුණු කසළ

පළමු වර්ගයෙන් ජීවාත්තික සහිත විෂ වායුව ඇතිවීම නිසා මනුෂ්‍ය ජීවිතයන්ට ද හානිකර ය. මේවා දළ වශයෙන් මාකට්, ගෙවල් සහ කඩ, හෝටල් හා ජංගම වෙළෙඳසැල් වලින් ඉවත දමන දේවල් ය. මේවා බැහැරවීම සඳහා ක්‍රම කිපයකින් විසඳුම් ලබාදිය හැකි වෙයි.

**(1) සත්ත්ව ආහාර සඳහා** හරකුන්, එළුවන්, ඌරන් ආදී සතුන්ගේ පරිභෝජනය සඳහා යොදා ගත හැකි කුණු කසළ වන්නේ ඉවත දමන එළවළු ය. දිනපතා මාකට් වලින් ටොන් ගණනින් ඉවත දමන මේ ද්‍රව්‍ය ඌරු කොටු කාරයන්ට අවශ්‍ය වනවා පමණක් නොව වෙනත් සතුන්ගේ ආහාර සඳහා ද යෙදිය හැකි ය. ගවයන්ගේ ද එළුවන්ගේ ද, කුකුළන්ගේ ද, හොඳ ආහාරයකි එය. එසේම මේ ඓන්ද්‍රීය කුණු කසළ එම සතුන් සඳහා විකුණා මුදල් ද ඉපයිය හැක්කේ ඒවා ක්‍රමානුකූලව එකතු කිරීමෙනි. එළවළු අපද්‍රව්‍ය රැස් කිරීමට වෙනම භාජන තැබීමෙන් ඒවා කළහැකි වන්නේ වෙළෙන්දන් දැනුවත් කිරීමෙනි.

**(2) ජීව වායුව නිපදවීම සඳහා** ඓන්ද්‍රීය අපද්‍රව්‍ය මගින් ලෙහෙසියෙන් ම ජීව වායුව නිපදවිය හැකි ය. මෙය නගරයට වඩා ගම්බද ප්‍රදේශ සඳහා යොදා ගත හැකි අගනා ක්‍රමයකි. ආහාර පිසීම සඳහාත් නිවාස ආලෝක කිරීම සඳහාත් මේ වායුව යොදා ගත හැකි අතර ඉතිරිවන අවශේෂයන් පොහොර සඳහා ද යොදගත හැකි වෙයි.

ඩී. පී. ඒ. නිමල්සූරිය

**(3) කොම්පොස්ට් පොහොර නිපදවීම සඳහා** ඓන්ද්‍රීය අපද්‍රව්‍ය එක්රැස්කොට වලවල්වල ගොඩගසා තැබීමෙන් තමාගේ ප්‍රයෝජනයට අවශ්‍ය අගනා පොහොරක් නිපදවිය හැකි ය. මේ සඳහා ඉඩකඩට වඩා අවශ්‍ය වන්නේ දැනුවත් වීමයි.

තමාගේ ඉඩම සුළු ප්‍රමාණයක් වුවද එහි වළක් කපා තමාගේ ගෙදර එකතුවන කුණු කොළරොඩු දමා තැබීමෙන් එළවළු සහ මල් සඳහා අගනා පොහොරක් ඉතා කෙටි කාලයකින් නිපදවා ගත හැකි ය.

**(4) ගිනිදැල්වීම සඳහා** ප්‍රදේශයේ ලී මෝල්, සහල් මෝල්, කොහු මෝල් ආශ්‍රිතව කර්මාන්ත රාශියක් ආරම්භ කළ හැකිය. ලී කුඩු සහ දහයියා කුඩු ගිනි මෙලවීම සඳහා අගනේ ය. ඉවත දමන දහයියා දැවීමෙන් බලශක්තිය නිපදවා ගත හැකි ය. එමගින් පාන් පිළිස්සීම හා ගඩොල් පිළිස්සීම, වලං පිළිස්සීම වැනි කටයුතු සඳහා යොදගත හැකි වෙයි. කොහුබත් වගාවත් සඳහා හොඳ පොහොරකි. වල්පැළෑටි මර්දනය සඳහාත් පසේ තෙතමනය රඳවා ගැනීම සඳහාත් පොළොව මත කොහුබත් ඇහිරිය හැකි වෙයි.

එපමණක් නොව සුලං නොවදින සේ පුළුස්සා ගන්නා ලද කොහුබත් හොඳ කාබන් විශේෂයකි. මෙමගින් මුද්‍රණ තීන්ත නිෂ්පාදනය කළ හැකි වෙයි.

එසේ ම නාගරිකව විශාල වශයෙන් ඉවත දමන තැඹිලි සහ කුරුම්බා කෝම්බ ගිනියට පලා වේලීමෙන් දර ප්‍රශ්නය ද විසඳ ගත හැකි වෙයි.

**(5) කුණු, මෝල් මගින් පිළිස්සීම** නගරයේ හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශවල ද ඉතිරිවන කුණු කසල කීප පලක ඇතිකරනු ලබන පිළිස්සීම් උදුන් මගින් පුළුස්සා දැමිය හැකි ය. මේ සඳහා වියළි කොළ රොඩු හා ඉවත දමන කඩදාසි වැනි දෑ ද යොදා ගත හැකි ය.

මේ මගින් නිපදවන අළු පොහොරක් වශයෙන් භාවිත කළ හැක. එසේ ම එයින් ලැබෙන උෂ්ණත්වය වෙනත් ස්ථානවලට ගෙන ගොස් වියළීමේ කටයුතු සඳහා යොදා ගත හැකි ය. විශේෂයෙන් වී වේලීම, රබර් වේලීම ආදී කටයුතු සඳහා යොදා ගත හැකි වෙයි. ඉවත දමන කඩදාසි වැනි දෑ නැවත කඩදාසි සෑදීමට ද රෙදි කැලි වැනිදෑ ඇස්බැස්ටස් නිපදවීමට ද ගත හැකි වනවා ඇත. අප මෙතෙක් කතා කළේ ඓන්ද්‍රීය අපද්‍රව්‍ය ගැනයි. ඓන්ද්‍රීය නොවන අපද්‍රව්‍ය වශයෙන් ප්ලාස්ටික් ඇතුළත් වෙයි.

මේවා වර්ග කිරීමෙන් නැවත ප්‍රයෝජනයට ගත හැකි ය. ඒවායින් ප්ලාස්ටික් කෑට නිපදවීම පුටු ආදි ගෘහභාණ්ඩ නිෂ්පාදනය, සෙල්ලම් බඩු නිෂ්පාදනය කළ හැකි ය. වෙනත් ප්ලාස්ටික් නිෂ්පාදනය ද මේ ඉවත දමන ප්ලාස්ටික් අපද්‍රව්‍ය මගින් කළ හැකි වන අතර මේ මගින් විශාල පිරිසකට රැකී රක්ෂා ද ලබාගත හැකි වනවා ඇත. මේ සඳහා ක්‍රමානුකූල සැලැස්මක් ඇති කිරීමත් ඒ සඳහා වෙන වෙනම අපද්‍රව්‍ය වර්ග කිරීමත් අවශ්‍ය වෙයි.

ගෙවල හා ව්‍යාපාරික ස්ථාන, කඩසාප්පු ආදියේ කුණු කසල බැහැර ලෑමේදී වෙන් වෙන්ව තෝරා අවශ්‍ය බඳුනකට හෝ භාජනයකට දැමීමෙන් තිසි ප්‍රයෝජන ලැබිය හැකි ය. උදහරණයක් වශයෙන් හෝටලයක් ගනිමු. එහි අපද්‍රව්‍ය නැතහොත් කුණු කසල වශයෙන් ඇත්තේ කුස්සියේ ඉවත දමන පොල් රොඩු, එළවළු අපද්‍රව්‍ය ඉතිරිවන බත් මාළු ආදියයි. මේවා වෙනම ම භාජනයකට දැමිය හැක. ජලයට අත පිසින කඩදාසි. ඒවාද වෙනම ම භාජනයකට දමා තැබිය හැකි අතර අනෙක් වර්ගය ප්ලාස්ටික් ය. ඒවා ද වෙනම ම එකතු කිරීමෙන් වෙන වෙනම ගෙන යාමට දිය හැකි ය. එළවළු, බත්, පාන් වැනි අපද්‍රව්‍ය වලින් සතුන්ට කෑමත් ජීවවායුවත් ජීවාන්තක පොහොරක් වශයෙනුත් ප්‍රයෝජනවත් වන අතර මා පෙර කී පරිදි කඩදාසි ද ප්ලාස්ටික් ද වෙන වෙනම ප්‍රයෝජනයට ගත හැකි වෙයි. මේවා මගින් ජපන් රට වැනි රටවල මහා පරිමාණයේ කර්මාන්ත කරන අතර ලංකාවේද එම ක්‍රමය අනුගමනය කළ හැක. මස් කඩ වලින් ඉවත දමන ඇට කටු පොහොර වශයෙන් යෙදිය හැක.

එහෙත් අපේ රටේ නගර සභාවන් සියලුම දේ කුණු ලොරියේ පටවාගෙන ගොස් දමන අතර ඒවායින් කිසිම ප්‍රයෝජනයක් කිසිවෙකුට ලබා ගත නොහැකි ය. එසේම දුර්ගන්ධය, මැසි මදුරුවන්, සර්පයන් බෝවීම, පරිසර දූෂණය ඇතිවීම වලක්වා ගත හැක්කේ මේ මගින් පමණ ය. දියුණු රටවල දියුණු නගරවල වෙසෙන කෝටි සංඛ්‍යාත මහ ජනතාව ඉවතලන කුණු රොඩුවලට කුමක් කරන්නේදැයි අධ්‍යයනය කළ යුතු ය. ජපානයේ පාවිච්චි කරන ලද යාන වාහන තලා මුහුදට දමා ඒ මගින් මාංචන් හා ඉස්සන් බෝවීම ඇති කරති. නැත්නම් ප්‍රයෝජනයට ගත නොහැකි යකඩ සුන් බුන් උණුකොට නැවත යකඩ සාද ගනිම ය. ලංකාවේ ද එවැනි කර්මාන්තශාලා පිහිටුවහොත් ඒ මගින් රැකී රක්ෂා විශාල ප්‍රමාණයක් මෙන් ම ප්‍රයෝජනවත් දෙයක් නිපදවිය හැකි ය.

ලංකාවේ ඕනෑ තරම් පහසුකම් තිබියදීත් ඒවා පිටරටින් ගෙන්වීමට අපි උත්සහ කරමු. පරිසර දූෂණය මගහරවා ගැනීම සඳහා මා කලින් සඳහන් කළ පරිදි ලී කුඩු දහයියා, කොහුබත් උපයෝගී කොට ගෙන විශාල කර්මාන්ත ආරම්භ කළ හැක. කොහුබත් උපයෝගී කොට ගෙන කර්මාන්ත කිපයක් අරඹා ඇති බව මම පත්‍රයක දුටිමි. එසේම තවත් එවැනි කර්මාන්ත කළ හැකි ය. දහයියා වලින් කලින් කීවා වගේ පාන් පෝරණු සඳහා සහ ගඩොල් පෝරණු සඳහා දව වෙනුවට යොදා ගත හැකි ය. වියළි කලාපයේ වැව් පිටි, දහයියා වලින් පුරවා ඇත. වැසි සමයේ දී ඒවා සේදී ගොස් වැව් ගොඩ වෙනවා පමණක් නොව ජලය ද අපවිත්‍ර වෙයි. මේවායින් ගත හැකි තවත් ප්‍රයෝජන සොයා බැලිය යුතු ය. එමගින් කර්මාන්ත ඇරඹීම නිසා රැකීරක්ෂා හිඟයට පිළියමක් ද වෙයි. නාගරිකව මිසක පිටිසරට කුණු කසල ප්‍රශ්නයක් නොවේ. නගරයේ වුව ද ක්‍රමානුකූලව ඒවා බැහැර ලීමේ ක්‍රම ඇත්නම් ප්‍රශ්නයක් නොවේ.

මේ ප්‍රශ්නය අද පමණක් නොව හෙටත් ඇතිවන්නේ ය. ඒ නිසා එයට ස්ථිරසාර විසඳුමක් අත්‍යවශ්‍ය ය. තාවකාලික විසඳුම් ප්‍රශ්නය තව තවත් උග්‍ර අතට හරවයි. වග කිය යුත්තන් එය අවබෝධ කර ගත යුතු කාලය එළඹ ඇතැයි සිතමි. අපට කුණු ගොඩත් ප්‍රශ්නයක්!

# හණ සංකල්පය

ඒක්තරා හණ නිල්ලක අයිනක නිල්පාට හණ පඳුරක් තිබුණා. මේ හණ පඳුර උද හිරු එළියත්, වැහි තුෂාරයත් වැටීමෙන් ඉතාමත් අලංකාරව වැඩුණු අතර ස්වාභාවික අලංකාරය නිසා මේ හණ පඳුරු නිතරම ආඩම්බරයෙන් මානයෙන් පෙලුණා.

හණ පඳුර සිතුවේ එයා තමයි මේ ලෝකේ ඉන්න ලස්සනම හා වාසනාවන්ත ම පුද්ගලයා කියල. ඒත් හණ පඳුරේ මේ බොළඳ අදහසට ඒ අසල සිටි ඉනි වැටත් සරදම් කළා. එහෙත් වැට හණ පඳුරට පැහැදිලි කරලා දුන්නා. හණ පඳුරේ අදහස වැරදි බවත්, ලෝකය ඊට වඩා වෙනස් බවත්. අවසානයේ දී මේ ජීවිතය දැවී පිලිස්සී අළු බවට පත්වෙන බවත්. ඒත් ආඩම්බරකාර හණ පඳුර ඉනි වැටේ අදහස පිළිගැනීමට කැමති වුණේ නැහැ. එයා තමා ගේ මතයේ දැඩි ලෙස එල්බ ගෙන සිටියා.

දින කිහිපයක් ඉක්ම යාමෙන් පසු එහි පැමිණි මිනිසුන් පිරිසක් විසින් හණ පඳුරු උදුරා ගඟේ පාකරගෙන ගොස් ගින්දරට අල්ලා වියළා ගත්තා. ගින්නට ඇල්ලීමෙන් ලත් වේදනාව නිසාම හණ පඳුරට එක් සත්‍යයක් මතක් වුණා. හැම විටම තමන් සිතන දේ ම සිදු නොවන බව ඒ සත්‍යය යි. එහෙත් හණ පඳුරේ ආඩම්බර බව නම් අල්පයක් හෝ අඩු වුණේ නැහැ. ඉන් අනතුරුව සියල්ල ම සිදුවුණේ හණ පඳුරේ විනාශයටම බරව යි. හණ පඳුර සහමුලින් ම කපා දැවැන්ත යන්ත්‍රයට දමනු ලැබුවා. යන්ත්‍රයේ ඇඹරෙමින් ලත් වේදනාවත් සමග ම හණ පඳුරට සිය අතීතය මතක් වුණා.

ටික මොහොතකින් මේ හණ පඳුර ලිනන් රෙද්දක් බවට පත් වුණා. මේ වෙනස් වීමෙන් පසු ලිනන් රෙද්ද තවත් ආඩම්බර වුණා. තමා ලිනන් රෙද්දක් බවට පත්වීම භාග්‍යයක් බවත් ඉනි වැටේ කතාව සහමුලින් වැරදි බවත් මේ ජීවන ගීතය හිතන තරම් ඉක්මනින් කෙලවර නොවන බවත්, හණපඳුරක්ව සිටි කාලයේ ලැබූ සැලකිලිවලට වඩා ගරු සැලකිලි දැන් ලැබෙන නිසා, තමා තරම් වාසනාවන්තයෙකු ලෝකයේ තවත් ඉන්නේ දැයි හණ පඳුරට සිතුණා.

එහෙත් වැඩි කලක් නොගොස් ම නිවසකට ගෙනයනු ලැබූ ලිනන් රෙද්ද ගෘහණිය විසින් කැබලිවලට කඩා ඇඳුම් මසනු ලැබුවා. ඉක්බිති මේ එක් එක් ඇඳුම ඔවුන් මෙවැනි තත්ත්වයකට පත්වීම වඩා යහපත් බවත් දැන් ඔවුන් තව තවත් ලෝකයට ප්‍රයෝජනවත් බවත් සිතන්නට වුණා.

වසර කීපයක් ඉක්ම යාමෙන් ලිනන් ඇඳුමටත් වෙනස්වීමේ න්‍යායෙන් ගැලවීමට නොහැකි වු අතර ඉරී වැරහැලි වූ ඇඳුම් කැබලි මිනිසුන් විසින් ගොඩගසා අඹරා භාජනයකට දමා උදුනක රත් කරනු ලැබුවා. ඉන්පසු එය සුදු කඩදාසියක් බවට පත් වුණා. කරදාසියක් බවට පත් වූ ලිනන් රෙද්ද තව තවත් උද්දමයට පත් වුණා. තමා පුදුමාකාර වාසනාවන්තයෙක් බවත් පෙරට වඩා තමා දැන් ලස්සන බවත් දැන් තමා මත වටිනා දේවල් ලිවීමෙන් තමා ඉතා කීර්තිමත් කෙනෙකු වන බවත් එය කල්පනා කළා.

කරදාසිය සිතූ පරිදි ම ඒ මත ලියූ වටිනා දේ කුඩා ළමුන් සහ මිනිසුන් ආශාවෙන් කියවූ අතර එම කතා තුළින් මිනිසුන් ගේ බුද්ධිය වැඩෙන බව ඔවුන් විශ්වාස කළා. එහෙත් මොහොතින් මොහොත තමන් විනාශය කරා ළඟාවන බව කඩදාසිය සිතුවේ නැහැ.

මේ අවස්ථාවේ තමා ලෝකයේ පණිවුඩ කාරයෙක් ලෙස විවිධ රටවලට පිටත් කර යවාවී යැයි කඩදාසිය සිතුවා. ඒත් කඩදාසියේ සිහිනය බිඳ වැටුණා. වෙනත් මුද්‍රණාලයකට රැගෙන ගිය ඒ කඩදාසියේ තිබූ කතා වෙනත් කඩදාසියක මුද්‍රණය කර කඩදාසිය මුද්‍රණාලයේ පැත්තකට විසි කරනු ලැබුවා. ඒත් ඉන්පසුව කඩදාසිය උද වු එම තත්ත්වය වඩාත් හොඳ බවත්, විශාල වැඩ කොටසක් කිරීමෙන් පසු විවේකයක් ගැනීමට හැකි වීම වාසනාවක් බවත් සිතුවා.

එහෙත්, මදු කඩදාසි පුළුස්සා දැමීම සඳහා උදුනට දමනු ලැබුවා. එහි ගින්නෙන් කඩදාසිය පිලිස්සී ගිනිදැල් නැගුණා. කඩදාසිය ගිනිගෙන ගිනිදැල් නැගෙද් දී හණ පඳුරක් හෝ ලිනන් රෙද්දක්ව සිටි කාලයේ දී මෙවැනි ඉහළ යාමක් ලබාගත නොහුණ බව කල්පනා කරන්නට වුණා. එහෙත් එසැනින් කඩදාසිය අළු ගොඩක් බවට පත්වී පොළව පුරා විසිර ගියේ සැම ගේ ම පයට පෑගෙමින්.

එසේ නමුදු ජීවන ගීතය අවසාන වන්නේ නැති බව අළු ගොඩ සිතා ගත්තා.

**පසුවදන – මේ කතාව හණ පඳුරක් පිළිබඳව වුවත් මනුෂ්‍ය ජීවිතයට ද අදාළ ය. සෑම දෙයක් ම වෙනස්වන න්‍යාය මත සංකේතාත්මක ව සාකච්ඡා කරන වෙනස් වීමේ සංකල්පය අර්ථ දක්වන මෙය සුරංගනා කතාකරු හාන්ස් ක්‍රිස්ටීන් ඇන්ඩර්සන් ගේ කතාවකි**

**රොෂාන් වික්‍රමනායක**